# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 1526/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 30/09/2024 පැය 1005

## මාධ්‍ය නිවේදනය

**අන්තර්ජාලය මගින් ගණුදෙනු කිරීමේදී සිදු වන විවිධ වංචනික ක්‍රියාවන්ට හසු නොවන ලෙස මහජනතාව දැනුවත් කිරීම - පොලිස් මූලස්ථානය.**

අන්තර්ජාලය භාවිතා කරමින් මාර්ගගත ක්‍රමයට (Online) බැංකු ගණුදෙනු කිරීමේදී ගණුදෙනුකරු හඳුනා ගැනීම සහ එම ගණුදෙණුවේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අදාල බැංකු ආයතනය මගින් එක් වරක් පමණක් ලබා දෙනු ලබන කේත අංකයක් (One Time Password / OTP) ගණුදෙනුකරුවන් වෙත ලබා දීම සිදු කරනු ලබයි. එම කේත අංකය ඇතැම් පුද්ගලයන් විසින් සමාජ මාධ්‍ය තුල වට්ටම්, ත්‍යාග සහ දිනුම් ඇදීම් ආදිය ලබා දෙන බවට පවසමින් ප්‍රසිද්ධ සන්නාම සහ සේවා ලෙස පෙනී සිටිමින් සංසරණය වන ව්‍යාජ වෙළඳ දැන්වීම්වලට හසුව, ව්‍යාජ වෙබ් පිටු වෙත යොමුවී එසේ තමාට ලැබෙන කේත අංක (OTP) සමහර ගණුදෙනුකරුවන් විසින් තම නොදැනුවත්කම මත තෙවන පාර්ශවයන් වෙත ලබා දීම සිදු කරන බව නිරීක්ෂණය වී ඇත.

ගණුදෙණුකරුවන් එසේ තම කේත අංකය (OTP) බාහිර පුද්ගලයන්ට ලබා දීමෙන් අන්තර්ජාලය හරහා සිදු කරන විවිධ වංචනික ක්‍රියාවන්ට හසුව එම පුද්ගලයන්ගේ ගිණුම්වල ඇති මුදල් විශාල වශයෙන් වංචනික පුද්ගලයන් විසින් ලබා ගැනීමේ සිද්ධීන් ගණනාවක් මේ වන විට වාර්තාවී ඇත.

අන්තර්ජාලය භාවිතා කර මෙම වංචනික ක්‍රියාවන් සිදු කරන විවිධ පුද්ගලයන් විසින් ගණුදෙනුකරුවන්ට ලැබෙන කේත අංකය (OTP) ලබා ගැනීම සඳහා භාවිතා කරන ඉහත ආකාරයේ කූඨ උපක්‍රම වලට හසුව කිසිදු අවස්ථාවක එම අංකය බාහිර පාර්ශවයන් වෙත ලබා දීමක් සිදු නොකරන ලෙසත්, මෙම වංචනික ක්‍රියාවන්ගෙන් ආරක්ෂා වීමට අදාල බැංකු මගින් ලබා දෙන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කර තම ගණුදෙනුවල හා ගිණුම්වල පවතින මුදල්වල සුරක්ෂිතතාවය තහවුරු කර ගන්නා ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

එසේම අන්තර්ජාලය හරහා සිදු කරන මෙවැනි ගණුදෙනුවලදී යම් ගැටළුකාරී තත්ත්වයක් පවතීනම් අදාල බැංකුව සමඟ සම්බන්ධවී අවශ්‍ය තොරතුරු තහවුරු කර ගැනීමේ කටයුතු සිදු කර ගන්නා ලෙසට එම ගණුදෙනුකරුවන්ගෙන්ද, මෙම වංචනික ක්‍රියාවන්ට හසු නොවන ලෙසට හා අනුගමනය කළ යුතු අවශ්‍ය ආරක්ෂිත ක්‍රමවේද පිළිබඳව තම ගණුදෙනුකරුවන් නිරන්තරවම දැනුවත් කරන ලෙසටද අදාල බැංකු ආයතන වලින්ද පොලිසිය වැඩිදුරටත් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**